# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 1740/5 - 2012 ජනවාරි 10 වැනි අඟහරුවාදා - 2012.01.10**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය : 14/CPH/GEZ/2011.

### සංගණන ආඥාපනත

සංගණන ආඥාපනතේ (143 අධිකාරයේ) 5 වැනි වගන්තිය යටතේ මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යවරයා විසින් පනවන ලද ව්‍යවස්ථා.

මහින්ද රාජපක්ෂ,
මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍ය.

2011 දෙසැම්බර් මස 29 වැනි දින,
කොළඹ දී ය.

ව්‍යවස්ථා

I කොටස - ප්‍රාරම්භය

1. මෙම ව්‍යවස්ථා 2011 ජන හා නිවාස සංගණන ව්‍යවස්ථා යනුවෙන් දක්වනු ලැබේ.

2. මෙම ව්‍යවස්ථා සම්බන්ධයෙන් අන්‍ය අර්ථකථනයක් අවශ්‍ය වුවහොත් විනා 'ආඥා පනත' යනුවෙන් සංගණන ආඥා පනත (143 අධිකාරය) ද, 'අධිකාරි' යනුවෙන් සංගණන අධිකාරිවරයා ද, 'කොමසාරිස්' යනුවෙන් සංගණන කොමසාරිස්වරයා ද, 'නියෝජ්‍ය කොමසාරිස්' යනුවෙන් නියෝජ්‍ය සංගණන කොමසාරිස්වරයා ද 'සහකාර කොමසාරිස්' යනුවෙන් සහකාර සංගණන කොමසාරිස්වරයා ද අදහස් කෙරේ.

II කොටස - සාමාන්‍ය

1. ජන හා නිවාස සංගණනය - 2011 හි ගණන් ගැනීමේ අදියරේ කටයුතු පහත සඳහන් පරිදි පැවැත්විය යුතු වේ.

| | *ක්‍රියාවලිය* | | *කාලවකවානුව* |
|---|---|---|---|
| (i) | සාමාන්‍යයෙන් පදිංචි ස්ථානය අනුව පුද්ගලයින්ගේ තොරතුරු හා නිවාස ඒකකවල තොරතුරු එක්රැස් කිරීම | - | 2012 පෙබරවාරි 27 සිට මාර්තු 19 |
| (ii) | සංගණන දිනය | - | 2012 මාර්තු 20 |
| (iii) | සංශෝධන වටය<br>සංගණන දිනය හා සංගණන මොහොත පදනම් කරගෙන සාමාන්‍යයෙන් පදිංචි පුද්ගලයින්ගේ තොරතුරු සංශෝධනය කරමින් ගණන් ගැනීම | - | 2012 මාර්තු 20 සහ 21 |

1A - G 15539 — 1335 (2012/01)

2. සෑම පුද්ගලයකුම, සංගණන උපලේඛනය සම්පූර්ණ කිරීමට අවශ්‍ය තොරතුරු ගණන් ගන්නා නිලධාරිට හෝ කොට්ඨාසයේ සංගණන අධීක්ෂණ නිලධාරිට හෝ ඒ සඳහා කොමසාරිස් විසින් පත් කරනු ලබන වෙනත් අයෙකුට සැපයිය යුතුය.

3. හැකිතාක් දුරට අධිකාරි විසින් ගැසට් නිවේදනයකින් නියම කරන කාලයක් තුළදී, අධිකාරි සුදුසු යයි නිගමනය කරන පරිදි, ආකෘති පත්‍රවල ඇතුලත් කරන ලද තොරතුරුවල තත්වය පිළිබඳව පරීක්ෂණයක් පවත්වනු ලැබේ.

III කොටස - සංගණන නිලධාරින්ගේ රාජකාරි කටයුතු

1. ආඥා පනතින් හෝ ඒ යටතේ පනවන ලද යම්කිසි ව්‍යවස්ථාවකින් අධිකාරිවරයා වෙත පවරන ලද හෝ ප්‍රදානය කරන ලද ඕනෑම බලයක් හෝ රාජකාරියක් අධිකාරිවරයාගේ පොදු හෝ විශේෂ විධානය පරිදි, නියෝජ්‍ය සංගණන අධිකාරිවරයෙක් විසින් දිවයින තුළ ද, ප්‍රදේශයක් භාර නියෝජ්‍ය/සහකාර සංගණන අධිකාරිවරයෙක් විසින් එම නියෝජ්‍ය/සහකාර සංගණන අධිකාරිවරයාට නියමිත ප්‍රදේශය තුළ ද ක්‍රියාවේ යෙදවීම හෝ ඉටු කිරීම කළ හැකිය.

2. ආඥා පනතින් හෝ ඒ යටතේ පනවන ලද යම්කිසි ව්‍යවස්ථාවකින් කොමසාරිස්වරයෙකු වෙත පවරන ලද හෝ ප්‍රදානය කරන ලද ඕනෑම බලයක් හෝ රාජකාරියක් එම ප්‍රදේශයේ කොමසාරිස්වරයාගේ පොදු හෝ විශේෂ විධානය පරිදි, තමා පත් වී සිටින ප්‍රදේශ සීමාව තුළ ක්‍රියාවෙහි යෙදවීම හෝ ඉටු කිරීම නියෝජ්‍ය කොමසාරිස්වරයෙකු විසින් කළ හැකිය.

3. සෑම අධීක්ෂණ නිලධාරියෙක්ම, සංගණන අධිකාරි හෝ තමා අධීක්ෂණ නිලධාරියෙකු වශයෙන් පත් වී ඇති කොට්ඨාසය භාර කොමසාරිස් හෝ නියෝජ්‍ය කොමසාරිස් විසින් නියම කරන ලද දිනවල දී, නියම කරන ලද ස්ථානවල දී හා වේලාවන් හි දී පුහුණු පන්තිවලට හා පරීක්ෂණවලට පැමිණිය යුතුය.

4. සෑම ගණන් ගන්නා නිලධාරියෙක්ම, තමා ගණන් ගන්නා නිලධාරි වශයෙන් පත් වී ඇති කොට්ඨාසයේ කොමසාරිස් හෝ නියෝජ්‍ය කොමසාරිස් හෝ අධීක්ෂණ නිලධාරියා හෝ අධිකාරි විසින් නියම කරන ලද දිනවල දී, නියම කරන ලද ස්ථානවල දී හා වේලාවන්වලදී පුහුණු පන්තිවලට හා පරීක්ෂණවලට පැමිණිය යුතුය.

5. සංගණනය ගැනීමේ කාර්යය සඳහා යොදවන ලද සංගණන නිලධාරියෙකු විසින් හෝ වෙන යම් පුද්ගලයෙකු විසින්, සාමාන්‍යයෙන් එම සේවය සම්බන්ධයෙන් හැරුණු විට, උපලේඛනයක් සම්පූර්ණ කිරීම සඳහා තමන් විසින් ලබා ගන්නා ලද කිසියම් තොරතුරක් නීත්‍යානුකූල බලයක් නොමැතිව ප්‍රසිද්ධ කිරීම හෝ අන් කිසිවෙකුට දැනුම් දීම හෝ නොකළ යුතුය.

6. සංගණන ගැනීමේ කාර්යය සඳහා යොදවන ලද සංගණන නිලධාරියෙකු විසින් හෝ වෙනයම් පුද්ගලයෙකු විසින් එම සංගණනයට අදාළ උපලේඛන, පොත් හෝ වෙනත් ලියකියවිලි තමන්ගේ භාරයේ තිබෙන තෙක් නීත්‍යානුකූල බලයක් නොමැති කිසිවෙකුට ඒවා නොපෙන්විය යුතුය.

7. කිසියම් සංගණන කාර්යයක් සඳහා යොදවන ලද සංගණන නිලධාරියෙකු හෝ වෙනයම් පුද්ගලයෙකු විසින් තමා සේවයට පත් වූ අවස්ථාවේ දී පහත දැක්වෙන දිවුරුම් හෙවත් සහතික ප්‍රකාශය සම්පූර්ණකොට අත්සන් කළ යුතුය.

.......................................................................... වන මම .......................................................................... වශයෙන් මගේ යුතුකම් සංගණන ආඥා පනතේ නියමයන්ට හා ඒ යටතේ පනවා ඇති නීතිවලට එකඟව, විශ්වාසවන්තව හා අවංකව ඉෂ්ඨ කරන බවත්, එමෙන්ම සංගණන නිලධාරියෙකු වශයෙන් සේවය කිරීමේදී මට ලබාගත හැකි වන කවර නමුත් තොරතුරක් ඒ සඳහා නියමිත බලයක් නොලැබ ප්‍රසිද්ධ කිරීම හෝ එළිදරව් කිරීම නොකරන බවත්, විධිමත්ම, අවංකව හා සැබෑ වශයෙන් ද සහතික කොට/දිවුරා* මෙයින් ප්‍රකාශ කරමි.

............................................................
අත්සන.

මා ඉදිරිපිටදීය.

ස්ථානය : ............................................................

දිනය : ......................................

............................................................
අත්සන හා නිලය.

*අදාල නොවන වචන කපා හරින්න.

8. අධීක්ෂණ නිලධාරියෙකුගේ ධුරයට පහත් නොවූ, ධුරයක් දරන සෑම සංගණන නිලධාරියෙකුටම පූර්වෝක්ත ව්‍යවස්ථාව යටතේ සඳහන් දිවුරුම හෝ සහතික ප්‍රකාශය අන් සංගණන නිලධාරියෙකුගෙන් ලබා ගැනීමට හැකිය.

IV කොටස - සංගණන කටයුතු සඳහා ලබාගත යුතු තොරතුරු

1. සංගණන කටයුතු සඳහා සංගණන උපලේඛනවලින් ලබාගත යුතු තොරතුරු පහත සඳහන් වේ.

අ. ජන හා නිවාස උපලේඛනය

(i) පුද්ගලයින් සම්බන්ධයෙන් පහත දැක්වෙන තොරතුරු :-

නම : ..................................................................................................................................................

ජාතික හැඳුනුම්පත් අංකය : ................................................................................

ගෘහමූලිකට ඇති නෑකම : ....................................................................................

ස්ත්‍රී පුරුෂ භාවය : ............................................

උපන් දිනය : ....................................................

විවාහක තත්ත්වය : ......................................................

ආගම : ..............................................................................

ජන වර්ගය : ....................................................................

පුරවැසිභාවය : ...............................................................

උපන් දිස්ත්‍රික්කය : ..........................................................

සාමාන්‍යයෙන් පදිංචි මෙම දිස්ත්‍රික්කයේ දැනට පදිංචිව සිටින කාලය (අවුරුදු) : .............................

මීට පෙර (අවසන් වරට) පදිංචිව සිටි දිස්ත්‍රික්කය : ..................................................................

දැනට පදිංචි මෙම දිස්ත්‍රික්කයට පදිංචියට ඒමට හේතුව : ..................................................

ශාරීරික හා මානසික අපහසුතා : ...............................................................................

පසුගිය දින 30 තුළ නිරත වූ අධ්‍යාපන කටයුත්ත : .......................................................

අධ්‍යාපන කටයුත්ත සඳහා දිනපතා පිටත්ව යන්නේ මෙම ඒකකයේ සිට ද ? : ................................

ඉහලම අධ්‍යාපන සුදුසුකම : .................................................................

ඉහලම වෘත්තීය සුදුසුකම : ...................................................................

ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) සහතික ලාභියෙක් ද ? : ..................................................

කතා කිරීමේ, කියවීමේ හා ලිවීමේ හැකියාව : .................................................................

පරිගණක භාවිත කිරීමේ හැකියාව : .................................................................

පසුගිය මාස 12 ඇතුළත යෙදී සිටි කාර්යයන් සහ කාල සීමාව (සති වලින්) : ................................

පසුගිය මාස 12 ඇතුළත යෙදුනු ප්‍රධාන රැකියාව හෝ කළ කාර්යය : ...............................................

සේවා ස්ථානයේ කරනු ලබන ආර්ථික කටයුත්තේ (කෘෂිකාර්මික, කාර්මික, වෙළඳ, සේවා) ස්වභාවය : ....................

ආර්ථික කටයුත්ත සිදු කරන ස්ථානයේ හෝ සේවා ස්ථානයේ නම : ..................................................................

රැකියාව / ආර්ථික කටයුත්ත සඳහා දිනපතා පිටත්ව යන්නේ මෙම ඒකකයේ සිටද ? : ..................................

රැකියාවේ තත්ත්වය හා අංශය : .................................................................

පසුගිය මාස 12 ඇතුළත යෙදුනු ප්‍රධාන ආර්ථික නොවන කටයුත්ත : ..................................................................

මුළු සජීවී දරු උපත් ගණන : .................................................................

දැනට ජීවත්ව සිටින මුළු දරුවන් ගණන : .................................................................

අවසාන සජීවී දරු උපත සිදුවූ වර්ෂය හා මාසය : .................................................................

(ii) මෙම ගෘහ කාණ්ඩයේ කිසියම් සාමාජිකයෙකු නැවත පදිංචියට මෙම ගෘහ කාණ්ඩයට පැමිණීමේ අදහසින් මාස 6 කට වැඩි කාලයක් විදේශගත වී සිටී ද ? 'ඔව්' නම් :

නම : .................................................................

ස්ත්‍රී පුරුෂ භාවය : .................................................................

පසුගිය උපන් දිනට වයස (අවුරුදු වලින්) : .................................................................

පදිංචි රටේ නම හා කේතය : .................................................................

විදේශ ගතව ඇත්තේ රැකියාවකට / අධ්‍යාපනයට / වෙනත් : .................................................................

(iii) ගෘහ කාණ්ඩ තොරතුරු :

ගෘහ කාණ්ඩයේ සාමාන්‍යයෙන් පදිංචි පුද්ගලයින් ගණන : ..................................................................
බීමට ජලය ලබා ගන්නා ප්‍රධාන මාර්ගය : ..................................................................
ආහාර පිසීමට ගන්නා ප්‍රධාන ඉන්ධන වර්ගය : ..................................................................
ආලෝකය ලබා ගන්නා ප්‍රධාන මාර්ගය : ..................................................................
වැසිකිළි පහසුකම් : ..................................................................
වැසිකිළියේ ස්වභාවය : ..................................................................
ඝන අපද්‍රව්‍ය බැහැර කරන ප්‍රධාන මාර්ගය : ..................................................................
නිවසේ භුක්තිය : ..................................................................
පවත්නා සන්නිවේදන තාක්ෂණ උපකරණ : ..................................................................
නිවසේ සිට අන්තර්ජාලයට පිවිසීමේ පහසුකම : ..................................................................
නිවසින් පිටත ස්ථානයකින් අන්තර්ජාලයට පිවිසෙන්නේ ද ? : ...........................................
නිවසින් පිටත ස්ථානයකින් අන්තර්ජාලයට පිවිසෙන්නේ නම් එම ස්ථාන මොනවා ද ? : ........................................

(iv) නිවාස ඒකක තොරතුරු

ඒකකයේ ඇති ගෘහ කාණ්ඩ ගණන : ..................................................................
ඒකකයේ සාමාන්‍යයෙන් පදිංචි පුද්ගලයින් ගණන : ..................................................................
ඉදිකිරීම සඳහා යොදා ඇති ප්‍රධාන ද්‍රව්‍ය : ..................................................................
ඒකකයේ ව්‍යුහය : ..................................................................
සාදා නිම කළ වර්ෂය : ..................................................................
ඒකකයේ භාවිතය : ..................................................................
කාමර : ..................................................................
කාමර ගණන : ..................................................................

ආ. හිසට වහලක් නොමැති පුද්ගලයින් පිළිබඳ උපලේඛනය

නම : ...........................................................................................................................................
ජාතික හැඳුනුම්පත් අංකය : ..................................................................
ස්ත්‍රී පුරුෂ භාවය : ..................................................................
උපන් දිනය / වයස : ..................................................................
විවාහක තත්ත්වය : ..................................................................
ආගම : ..................................................................
ජන වර්ගය : ..................................................................
පසුගිය දින 30 තුළ නිරත වූ අධ්‍යාපන කටයුත්ත : ..................................................................
ඉහලම අධ්‍යාපන සුදුසුකම : ..................................................................
භාෂා කතා කිරීමේ, කියවීමේ හා ලිවීමේ හැකියාව : ..................................................................
රැකියාවක / ආර්ථික කටයුත්තක නියුක්ත වී සිටින්නේ ද ? : ..................................................................
ඔව් නම්, නියුක්ත වී සිටින රැකියාව / ආර්ථික කටයුත්ත : ..................................................................
ශාරීරික හා මානසික අපහසුතා : ..................................................................

2. සංගණන නිලධාරියෙකුට තමාගේ ප්‍රදේශය තුළ සිටින සියලුම පුද්ගලයින්ගෙන් ඔවුන් පිළිබඳව හෝ ඔවුන්ගේ ගෘහවල පදිංචි අයවලුන් පිළිබඳව මෙම කොටසේ I වන ව්‍යවස්ථාව යටතේ දැක්වෙන කරුණුවලට අදාළ ප්‍රශ්න විචාරීමෙන් හෝ එවැනි පුද්ගලයින් ලවා නියමිත ආකෘති පත්‍රවල අවශ්‍ය කරුණු ඇතුළත් කිරීමට සැලැස්වීමෙන්, සංගණන කටයුතු සඳහා අවශ්‍ය තොරතුරු ලබාගත හැක.

3. ජන හා නිවාස උපලේඛනය හා හිසට වහලක් නොමැති පුද්ගලයින් පිළිබඳ උපලේඛනය නිවැරදි ලෙස සම්පූර්ණ කර ඇති බව නිශ්චය කර ගැනීම සඳහා අවශ්‍ය ප්‍රශ්න ඕනෑම පුද්ගලයෙකුගෙන් ඇසීමට සංගණන නිලධාරියෙකුට පිළිවන.

4. සාමාන්‍යයෙන් පදිංචි ස්ථානය අනුව පුද්ගලයින් පිළිබඳව හා නිවාස පිළිබඳව ලබාගන්නා ලද තොරතුරු අධිකාරි සුදුසු යැයි නියම කරන ඕනෑම අවස්ථාවක ඕනෑම පුද්ගලයෙකුගෙන් නැවත විමසා දැනගැනීමට සංගණන නිලධාරියෙකුට පිළිවන.

5. මෙම කොටසේ I වැනි ව්‍යවස්ථාව යටතේ දැක්වෙන කරුණු කිසියම් පුද්ගලයෙකු වෙනුවෙන් සංගණනයේදී වාර්තාගත වී තිබේදැයි සෑහීමකට පත්වනු පිණිස, මෙම කොටසේ I වැනි ව්‍යවස්ථාව යටතේ දැක්වෙන කරුණු සියල්ලම හෝ කිහිපයක් වාර්තාගත කිරීම පිණිස අවශ්‍ය ඔහුගේ නම සහ සාමාන්‍යයෙන් ඔහු පදිංචිව සිටින ස්ථානය පිළිබඳ ප්‍රශ්න ඇසීමට සංගණන නිලධාරියෙකුට හැකිවන අතර එම ප්‍රශ්න වලට පිළිතුරු සැපයීම එකී පුද්ගලයාගේ යුතුකම වන්නේය.

6. ආඥා පනතේ හෝ ඒ යටතේ පනවා ඇති ව්‍යවස්ථාවක විධිවිධානයන් යටතේ උපලේඛනයක් සම්පූර්ණ කළ යුතු සෑම පුද්ගලයෙකු විසින්ම, එම උපලේඛනයෙහි හෝ වෙනත් උපලේඛනයක නම සඳහන් වී තිබෙන කිසියම් පුද්ගලයෙකු වෙනුවෙන් ඔහු විසින් ඇතුළත් කරන ලද කරුණු, අවශ්‍ය නම් සංශෝධන වටයේදී සංශෝධනය කිරීම සහ මෙම කොටසේ 1 වැනි ව්‍යවස්ථාව යටතේ දැක්වෙන දැනට ඇතුලත් කර නොමැති, යම් යම් කරුණු ඇතුළත් කිරීම ද කළ හැකි වන්නේය.

01-603

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.